*සැ. යු.-* 2010.01.15 දින පළ වූ අංක 1,637 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,638 - 2010 ජනවාරි මස 22 වැනි සිකුරාදා - 2010.01.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 456 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් සභා නිවේදන

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය /126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**රඹුක්කන ප්‍රාදේශීය සභාවේ එල්. පී. වායු මගින් ක්‍රියාත්මක වන ආදාහනාගාරය විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙය රඹුක්කන ප්‍රාදේශීය සභාවේ එල්. පී. වායු මගින් ක්‍රියාත්මක ආදාහනාගාරය පාලනය කිරීම හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පනවන අතුරු ව්‍යවස්ථාවයි. ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මෙය ක්‍රියාත්මක කරනු ලැබේ.

02. රඹුක්කන ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන මෙම ආදාහනාගාරය එල්. පී. වායුව මගින් ක්‍රියා කරනු ලබන රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය යනුවෙන් හැඳින්වේ.

03. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහුගේ බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයේ කිසිම මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතුය.

04. මෙහි තුන්වැනි වගන්තියේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මින් මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් මෙහි පළමුවන උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමඟ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය :

(i) මිය ගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා මිය ගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

(ii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධි විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර දෙමින් නිකුත් කරනු ලබන සහතිකය ;

(iii) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43-1 වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකය.

05. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් සභාපතිවරයා වෙත භාර දෙනු ලැබීමෙන් පසු ලැබුණු අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතුය.

06. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාර දෙනු ලබන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව හා රුපියල් දහසක තැන්පත් මුදලක් අය කර ගෙන අවසර ලබාදිය යුතුය. ආදාහනාගාරය භාරකරු වෙත මෘත ශරීරය භාර දිය යුතු වේලාව ද අවසර පත්‍රයේ සඳහන් කළ යුතුය.

07. මෘත ශරීරය ආදාහනය සඳහා භාර ගනු නොලබන්නේ නම් ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුය.

08. සභාවේ සේවය කළ හෝ දැනට සේවය කරන හෝ යම් කිසි සභාපතිවරයෙකු හෝ උපසභාපතිවරයෙකු හෝ මන්ත්‍රීවරයෙකු හෝ සභා සේවකයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීමක් සිදු කරනු නොලැබේ.

09. සභාව මගින් වරින් වර යෝජනා ස්ථිරත්වයෙන් තීරණය කරනු ලබන ගාස්තු ප්‍රමාණය අය කිරීමෙන් පසු මෘත දේහයක් ආදාහනාගාරයේ ආදාහනය කිරීමට ඉඩ දෙනු ලැබිය යුතුය.

10. සභාපතිවරයා විමසා ආදාහනාගාර, භාරකරුවෙකු, සහායකයෙකු හා මුරකරුවෙකු සබරගමුව පළාත් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

11. ආදාහනාගාරය භාරකරු ආදාහනාගාරයත් ඒ අවටත් පිරිසිදුව හා දැකුම්කළුව පවත්වාගෙන යා යුතුය.

12. 1975 අංක 41 දරන විවාහ, උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධි විධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ අදාළ වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන සහතිකයක් නොමැතිව කිසිම මෘත දේහයක් ආදාහනය නොකළ යුතුය.

13. මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කර ගන්නා අවස්ථාවේ මෘත දේහය ආදාහනය කිරීමෙන් පසු අළු තැන්පත් කර තැබීම සඳහා මරණකරුගේ නම හා ලිපිනය සඳහන් කර භාජනයක්, මිය ගිය අයගේ ළඟම ඥාතීන් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබා දිය යුතුය.

14. ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන අළු 13 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව භාර දී ඇති භාජනයකට දමා ප්‍රවේසම් සහිතව තත්කාර්ය සඳහා වෙන් කොට ඇති කොටසේ හෝ භූමියේ ආදාහනාගාර භාරකරු විසින් තැබිය යුතුය.

15. ආදාහනාගාරයෙන් ඉවත් කරන ලද අළු සහිත භාජනය දින 14ක් ඇතුළත මියගිය අයගේ ඥාතීන් විසින් රැගෙන නොගියහොත් හෝ 13 වැනි වගන්තියට අනුව භාජනය නොසපයන්නේ නම් තත්කාර්ය සඳහා සුසාන භූමියේ වෙන් කර ඇති කොටසේ සභාව විසින් භූමිදානය කළ යුතුය.

16. ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන අළු මියගිය අයගේ ළඟම ඥාතීන් හැර වෙනත් පුද්ගලයෙකුට භාර නොදිය යුතුය.

17. ආදාහනාගාරයේ ආදාහන කටයුතු සඳහා මෘත ශරීර භාර ගැනීම පෙ. ව. 6.30 සිට ප. ව. 8.00 දක්වා කාලය තුළ කළ යුතුය.

18. සභාපතිවරයා විසින් හා ලේකම් විසින් පවරනු ලබන රාජකාරි ලැයිස්තු අනුව ආදාහනාගාරය භාරකරු ක්‍රියා කිරීමට යටත් විය යුතුය.

19. සාමයට හා ආදාහන කටයුතුවලට බාධා වන ලෙසට යම් පුද්ගලයෙකු හැසිරෙන්නේ නම් ආදාහනාගාර භාරකරුට එම පුද්ගලයා ආදාහනාගාර පරිශ්‍රයෙන් ඉවත් කිරීමට බලය ඇත්තේ ය.

20. මිය ගිය අයට අවසන් ගෞරවය දැක්වීමට පැමිණෙන කිසිම පුද්ගලයෙකු සුසාන භූමියේ කිසිම ස්මාරකයකට හෝ ආදාහනාගාර ගොඩනැගිලි, දේපළවලට හෝ අලාභ වන අන්දමින් හෝ මළ ගිය අයට අගෞරවයක් වන අයුරින් නොහැසිරිය යුතුය.

21. 20 වැනි වගන්තිය උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙකුට සුසාන භූමි හා මිනී පිටි ආඥාපනත් විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය.

22. ආදාහනාගාර පරිශ්‍රයට මෙහි 17 වැනි වගන්තියේ සඳහන් කළ වේලාවෙන් බැහැරව විධිමත් අවසරයක් නොගෙන කිසිවෙකු ඇතුල් නොවිය යුතුය. ආදාහනාගාර කටයුතුවලින් පසු කිසිම කෙනෙක් නිකරුනේ එහි හැසිරීම හෝ කාලය ගත කිරීම නොකළ යුතුය.

23. ආදාහනාගාරයට හෝ ආදාහනාගාර පරිශ්‍රයේ ඇති ඉදිකිරීමකට හෝ සවි කිරීමකට කිසියම් අලාභ හානියක් හෝ හානියක් සිදු කිරීම හෝ ආදාහනාගාරයේ සේවයේ නියුතු භාරකරු, සහායකයින් හෝ සේවකයින්ගේ සේවා කටයුතුවලට බාධා කිරීමක් හෝ තර්ජනය කිරීමක් හෝ බලපෑම් කිරීම වරදක් වන්නේ ය.

24. ආදාහනාගාරය වෙන් කරනු ලබන අය විසින් හෝ ඔවුන්ගේ සහායක අය විසින් හෝ එහි යම්කිසි දේපළකට හෝ ගොඩනැගිල්ලකට හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදාහනාගාරය වෙන් කරනු ලබන අය එකඟ විය යුතුය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ 22, 23 හා 24 වගන්තීන් කඩ කිරීම වරදක් වන අතර ඒ සම්බන්ධයෙන් කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියෙන් නියම කර ඇති දඩයකට යටත් වන්නේ ය.

26. මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කරන අතරතුර දී හෝ ආදාහනය කිරීමට පෙරාතුව හෝ ආදාහනාගාර යන්ත්‍රවල කාර්මික දෝෂයක් හෝ විදුලිය ඇණහිටීමක් හෝ මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘත ශරීර භූමදාන කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතුය. මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන යම් ගැටළුවක දී සභාපතිවරයා ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල සභාව යන්නෙන් රඹුක්කන ප්‍රාදේශීය සභාව ද, සභාපති යන්නෙන් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, ලේකම් යන්නෙන් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද, මෘත ශරීර යන්නෙන් මිනිස් මළ සිරුරක් ද අදහස් වේ.

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල නොගැලපෙන යම් අවස්ථාවක දී සිංහල පිටපත බල පැවැත්වේ.

### *උපලේඛන අංක 01*

*රඹුක්කන ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
    ලිපිනය :————.
    ජාතික හැඳුනුම්පත් අංකය :————.
    ග්‍රාම සේවා කොට්ඨාශය :————.

02. මිය ගිය තැනැත්තාගේ නම :————.
    පදිංචිව සිටි ලිපිනය :————.
    ග්‍රාම සේවා කොට්ඨාසය :————.
    ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. මිය ගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :————.
04. මරණ සහතිකයේ අංකය හා දිනය :————.
    (මරණ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
05. මරණය ලියාපදිංචි කරන ලේකම්ගේ නම හා ලිපිනය :————.
06. මරණය සිදු වූ ආකාරය :————.
07. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :————.
08. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :————.
09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :————.
10. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග :————.
11. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :————.
12. ආදාහනයෙන් පසුව භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සපයා දී ඇත/නැත :————.

ඉහත සඳහන් තොරතුරු සියල්ල නිවැරදිව හා සත්‍ය බව සහතික කරමි.

අදාළ සහතික අමුණා ඇත.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

(i) අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි./නොකරමි. පහත සඳහන් හේතු මත අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

(ii)

(iii)

අත්සන :————.
සභාපති/බලයලත් නිලධාරි :————.
දිනය :————.

*සභාපති/බලයලත් නිලධාරි*

01. ලේඛනයේ සටහන් කරන ලදී. ......................................................................දින අංක ..............................දරන ලදුපතින් රු. ..................................හා තැන්පත් රු. ............................ක් වශයෙන් රු. .........................................අය කරන ලදී.

02. අවසර පත්‍රය සඳහා ඉදිරිපත් කරමි.

03. ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ඇතුළත් ලිපි අත්සන සඳහා ඉදිරිපත් කරමි.

දිනය :———————. ———————,
අත්සන.

01-537

---

දැරණියගල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**රථවාහන නවතා තැබීම් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රථ වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. දැරණියගල ප්‍රාදේශීය සභාවේ (මින් මතු සභාව යනුවෙන් හැඳින්වෙන) නගර සීමාව ඇතුළත IV වැනි උපලේඛනයේ දැක්වෙන මෝටර් වාහනයක් 1 වැනි උපලේඛනයේ දැක්වෙන පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක නියමිත ගාස්තු ගෙවීමකින් මිස නතර නොකළ යුතු වන්නේ ය.

03. පොදු වාහන නතර කරන ස්ථානයක කිසියම් තැනැත්තෙකු විසින් මෝටර් වාහනයක් එම වාහනයේ අයිතිකරු හෝ රියදුරු අත සභාව විසින් නිකුත්කරන ලද අවසර පත්‍රයක් ඇත්නම් මිස නතර නොකළයුතු වන්නේ ය.

04. වාහන නවතා තැබීමට අවසර දී ඇති ස්ථාන 1 වැනි උපලේඛනය යටතේ සඳහන් වේ.

05. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම එම අවසර පත්‍රය නිකුත් කරන ලද්දේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ මෝටර් වාහනය හඳුනා ගැනීමේ අංකය පැහැදිලිව සටහන් විය යුතු අතර අවසර පත්‍රයේ සඳහන් කාල සීමාව සඳහා පමණක් එය වලංගු වන්නේ ය.

06. පොදු වාහන නවතා තබන ස්ථානයක නවතා තබන යම් වාහනයක අයිතිකරු හෝ රියදුරු විසින් ඒ වාහනය සම්බන්ධයෙන් නිකුත්කර ඇති අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස පොලිස් නිලධාරියෙකු, රථවාහන පාලකයෙකු, ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ කවර හෝ තැනැත්තකු විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එම අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළයුතු වන්නේ ය.

07. යම් තැනැත්තෙකු මෝටර් වාහනයක් පොදු වාහන නවතා තබන ස්ථානයකට ඇතුළුවන්නා වූ හෝ පිටවන්නා වූ හෝ මෝටර් වාහනයකට බාධා වන අයුරින් තම වාහනය නවතා තැබීම නොකළයුතු වන්නේ ය.

08 (I) යම් තැනැත්තෙකු පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නවතා ඇති අවස්ථාවක එම වාහනය සේදීම නොකළ යුතුය.

(II) වාහනය අදාළ ස්ථානයෙන් ඉවත්කර ගැනීමට අවශ්‍යවන අලුත්වැඩියාවක් හැර අනෙකුත් අලුත්වැඩියාවන් නොකළයුතු වන්නේ ය.

09. මෝටර් වාහනය නවතා තිබෙන ස්ථානය තුළ කිසිවෙකු විසින් මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙළඳාම් නොකළ යුතු වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් නියමයන් එක් එක් දවසේ පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා පමණක් වලංගු වන්නේ ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩකිරීමක්ම වරදක්වන අතර කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙහි 122(2) උපවගන්තිය අනුව නියමකර ඇති දඩයකින් ද, වරද කිරීමෙන් පසුව ද එම කඩකිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩකිරීම කෙරෙහි අවධානය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව ද එම වරද නැවත නැවතත් කරගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය අනුව නියමකර ඇති අතිරේක දඩයකට යටත්විය යුතුය.

12. ත්‍රීවිල් රථ මෙහි II වැනි උපලේඛනයේ සඳහන් ස්ථානවල පමණක් නතර කර තැබිය යුතු අතර III වැනි උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉංග්‍රීසි හා දෙමළ පිටපත් හි නොගැලපෙන යම් අවස්ථාවක් වේ නම් සිංහල පිටපත බල පැවැත්වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවල අන්‍ය අර්ථයක් අවශ්‍යවුවහොත් මිස "මෝටර් වාහනයක්" යනුවෙන් අදහස් කරන්නේ ලොරියක්, ටේලරයක් සහිත ට්‍රැක්ටරයක්, වාහනයක්, ත්‍රිරෝද රථයක්, බස් රථයක්, කැබ්, ටිපර්, කාරයක්, යතුරු පැදියක්, ජීප් රථයක් වෙනත් යන්ත්‍රානුසාරයෙන් ගමන් කරනු ලබන වෙනත් කුමන හෝ වාහනයක් වන්නේ ය.

'සභාව' යන්නෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව අදහස් වේ.
'සභාපතිවරයා' යන්නෙන් දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.
'වාහන පාලක' යන්නෙන් සභාවෙන් පත්කරනු ලබන නිලධාරියෙකු අදහස් වේ.
'පොලිස් නිලධාරියෙකු' යන්නෙන් නිල ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරියෙකු අදහස් වේ.
'වාහන නතර කිරීම' යනුවෙන් මගීන් නැගීමට හෝ බැසීමට හෝ බඩු පැටවීමට හෝ බෑමට නතර කරනු ලබන වාහන හැර නියමිත ස්ථානයක නතර කරනු ලබන වාහන අදහස් වන්නේ ය.

### *I වැනි උපලේඛනය*

*වාහන නතර කර තැබීමට නියමිත ස්ථාන*

1. දේවාල හන්දියේ සිට වයින් ස්ටෝර්ස් දක්වා - දකුණු පස (ඉරිදා හැර)
2. දේවාල හන්දියේ සිට සිල්වා වෙළඳසැල දක්වා - වම් පස (ඉරිදා හැර)
3. ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට - වෑන් රථ සඳහා පමණි (ඉරිදා හැර)
4. පොදු වෙළඳපොළ අසල ක්‍රීඩා පිටිය - සියලුම වර්ගයේ වාහන
5. සිරිවර්ධන මාවත - සියලුම වර්ගයේ වාහන

### *II වැනි උපලේඛනය*

*සභාවේ අනුමැතිය ලත් ත්‍රීවීල් රථ නතර කර තබන ස්ථාන*

| | | |
|---|---|---|
| 1. | රෝහල ඉදිරිපිට | - දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ - වම්පස |
| 2. | පොදු වෙළඳපළ අසල | - දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ - දකුණු පස |
| 3. | ලංකා බැංකුව ඉදිරිපිට | - දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ - දකුණු පස |
| 4. | මියනවිට පාර | - දැරණියගල සිට මියනවිට මාර්ගයේ - වම් පස |
| 5. | ප්‍රධාන බස් නැවතුම්පළ අසල | - නූරිය සිට දැරණියගල මාර්ගයේ - වම් පස |
| 6. | ඉන්ධන පිරවුම් හල අසල | - දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ - වම් පස |

### *III වැනි උපලේඛනය*

*සභාවේ අනුමැතිය ලත් ත්‍රීවීල් රථවලින් අයකරනු ලබන ගාස්තු*

| | |
|---|---|
| වාර්ෂික ගාස්තුව (ස්ටිකරය සමග) | රු. 250 0 |
| මාසික අවසර පත්‍ර ගාස්තුව | රු. 150 0 |

### *IV වැනි උපලේඛනය*

*සභා අනුමැතිය ලත් ත්‍රීවීල් හැර අනෙකුත් වාහනවලින් අයකරනු ලබන ගාස්තු*

| *වාහන වර්ගය* | *අයකරනු ලබන ගාස්තුව රු. ශත* |
|---|---|
| 1. වෑන්, කාර්, ජීප් රථ, කැබ් රථ, මෝටර් රිය, ත්‍රි රෝද රථ | 30 00 |
| 2. බස් රථ (ලංගම හැර), ලොරි, ටිපර් රථ, ටේලර් සහිත ට්‍රැක්ටර්, ටේලර් සහිත වෙනත් වාහන | 40 0 |
| 3. වෙනත් මෝටර් වාහන | 50 0 |
| 4. යතුරු පැදි | 20 0 |

මෙම අතුරු ව්‍යවස්ථා, ගිලන් රථ, ගිනි නිවන රථ, රාජ්‍ය ආයතනවල රාජ්‍ය වාහන, ළමුන් සහිත පාසැල් සේවා වෑන් රථ යනාදියට අදාළ නොවේ.

01-535

---

## යටියන්තොට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

### අයාලේ යන සතුන්ගෙන් සිදුවන හානි අවම කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - යටියන්තොට ප්‍රාදේශීය සභාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අයාලේ යන සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා එකී සතුන් අල්ලා ගැනීම, ගාල් කර තැබීම, හා ඊට අදාළ අනෙකුත් කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලබන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානවල පොදු මංමාවත්, මාර්ග හා වීථිවල ගමන් ගන්නා මහජනයාට රථ වාහන ගමනාගමනයට අවහිර වන පරිදි යම් සතෙකු අයාලේ යාමට එම සතුන්ගේ අයිතිකරුවන් හෝ භාරකරුවන් ඉඩ නොතැබිය යුතුය.

03. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් විසින් නීත්‍යානුකූලව බලය පවරනු ලබන යම් පුද්ගලයෙකු අයාලේ යන සතුන් අල්ලා ගැනීම, එම සතුන් තමන් භාරයට ගැනීම සුදුසුයැයි තමන් විසින් තීරණය කරනු ලබන මාර්ගයක් ඔස්සේ ගාලකට ගෙන ඒම නීත්‍යානුකූල වන්නේ ය.

04. බලයලත් තැනැත්තෙකු විසින් අල්ලා ගනු ලබන සෑම සතෙක්ම හැකි ඉක්මණින් ඒ සඳහා සභාව විසින් සකස් කර ඇති ගාල වෙත ගෙනවිත් භාර දී අංක 01 උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයේ පරිදි සහතිකයක් ලබා ගත යුතුය.

05. බලයලත් තැනැත්තා විසින් අල්ලා ගනු ලබන සතුන්/සතා ගාලට භාර දෙන විට සතා අල්ලා ගත් දිනය, වේලාව සහ ස්ථානය, සතාගේ වර්ගය, ගැහැණු පිරිමි බව, සතාගේ පාට හා හඳුනාගැනීමේ සළකුණු වෙතොත් ඒවා ද ලේඛනයක ඇතුළත් කර මෙම සතුන් එම ගාල තුළට භාර ගත් බවට රැකවල් කරුගේ අත්සන සහිත සහතිකය ද ලබාගෙන එසේ භාර දුන් බවට තමා ද අත්සන කළ යුතුය. මෙම ලේඛනයේ සතුන් පිළිබඳ සටහන් තබා ඉක්බිතිව එළඹෙන කාර්යාල වේලාව තුළ දී ලේඛනය ලේකම්ගේ හෝ බලය පවරන නිලධාරියෙකුගේ අධීක්ෂණයට ඉදිරිපත් කර අත්සන් ලබා ගත යුතුය.

06. ගාල තුළට රැකවල්කරු විසින් භාර ගන්නා ලද සතුන් පිළිබඳ විස්තරයක් ද භාරගත් දිනය, වේලාව හා සභාපතිගේ/ලේකම්ගේ නිදහස් කිරීමේ නියෝගය ලැබුණු දිනය හා වේලාව ද නිදහස් කළ වේලාව ද ඇතුළත් ලේඛනයක් රැකවල්කරු විසින් පවත්වාගෙන යා යුතු අතර සතා භාර ගත් අයගේ අත්සන ද ලබාගත යුතුය.

07. සභාපතිගේ/ලේකම්ගේ ලිඛිත නියෝගයක් නැවත කිසිදු අවස්ථාවක දී කිසිම සතෙකු නිදහස් නොකළ යුතු අතර නියෝගයේ සඳහන් අයටම සතා ආපසු භාර දිය යුතුය.

08. අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීම සඳහා විධිමත් ගාලක් යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් සැපයිය යුතු අතර සතුන්ට ආහාරපාන හා රැකවරණය ලබා දීම සභාවේ වගකීම වන්නේය.

09. බලයලත් තැනැත්තා සතෙකු අල්ලා ගත් දින සිට ගාලෙන් නිදහස් කරන අවස්ථාව දක්වා කාලය තුළ සතෙකු රෝගාතුර වීම, මිය යාම පිළිබඳ කිසිදු වගකීමකට යටියන්තොට ප්‍රාදේශීය සභාව හෝ සභාවේ බලය පවරනු ලබන කිසිවකු වගකීමට බැඳී නැති අතර එවැනි කරුණක් වෙනුවෙන් කිසිදු වන්දියක් හෝ අලාභ හානියක් ගෙවීමට සභාව හෝ සභාවේ කිසිදු නිලධාරියෙකු හෝ සේවකයෙකු යටත් නොවන්නේය.

10. අල්ලා ගනු ලබන කවර වර්ගයේ හෝ සතෙකු අල්ලා ගැනීමේ ගාස්තු වශයෙන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන ගාස්තු රැකවල් ගාස්තු වශයෙන් ගාලේ රඳවා තබන පැය 24 ට හෝ ඊට අඩු කොටසකට සභාව විසින් වරින් වර නියම කරනු ලබන ගාස්තුවක් ද සතාගේ හිමිකරු හෝ භාරකරු විසින් සභාවට ගෙවා සතාගේ අයිතිය තහවුරු කරන තෙක් කිසිම සතෙකු නිදහස් නොකළ යුතුය.

11. හිමිකරුවෙක් හෝ භාරකරුවෙක් ඉදිරිපත් නොවන්නාවූද, නියමිත ගාස්තු ගෙවා නොමැති වූද අල්ලා ගත් දින සිට දින 07 කට නොවැඩි කාලයක් ගාල තුළ තබා සිටියා වූ ද කවර හෝ සතෙකුගේ හිමිකමක් සභාව සතු වන අතර සභාපතිවරයා විසින් තීරණය කරන අන්දමක දැන්වීමක් ප්‍රකාශ කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද මිලට ගත් අයට සතාගේ අයිතිය පැවරීම ද නීත්‍යානුකූල වන්නේ ය.

12. වෙන්දේසි කිරීමෙන් ලබා ගන්නා මුදලින් සභාවට අයවිය යුතු ගාස්තු අයකර ගෙන සතාගේ නියම හිමිකරු ඉල්ලා සිටිය හොත් ඉතිරි මුදල ගෙවීම පිළිබඳව සභාවට සලකා බැලිය හැක. වෙන්දේසි කිරීමෙන් මාස 06 කාලයක් ඉකුත් වීමෙන් පසුව ඉල්ලීම් පිළිබඳ සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවක දී ඉතිරි මුදල සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමේදී හෝ එකම අයිතිකරු විසින් අවස්ථා දෙකකට වැඩි වාර ගණනක දී තම සතුන් අයාලේ යවා අල්ලා ගත හොත් එය වරදක් වන අතර සතා නිදහස් කිරීමෙන් තොරව අයිතිකරු නිසි අධිකරණයකට ඉදිරිපත් කර වරදට වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වැනි වගන්තිය අනුව නියම කර ඇති දඩයට යටත් වේ. මෙම වරද දිගින් දිගටම කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වැනි වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දණ්ඩනයකට ද යටත් වනු ලබන්නේය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථ නිරූපණයේ දී යම් අපැහැදිලි තැනක් වුවහොත් සිංහල භාෂාවෙන් ඇති ව්‍යවස්ථාව වලංගු වන්නේය.

*අර්ථ නිරූපණය*

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සභාව යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව ද,

සභාපති යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ කටයුතු කරන අය ද, ලේකම් යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ එම තනතුරට පත් කළ අය ද, යම් සතෙකු/සතා යන යෙදුම් වලට ගවයෙකු, මී ගවයෙකු, පෝනියෙකු, අශ්වයෙකු, බැටළුවෙකු, එළුවෙකු හෝ ඌරකු ඇතුළත් වන අතර එකී සෑම වර්ගයකම ගැහැණු පිරිමි සතුන් ද අදහස් වේ. තවද ඒක වචනයෙන් දක්වා ඇති යම් යම් තැන්වලට අදාළ වන පරිදි බහු වචන අර්ථය ද ආදේශ විය යුතුවේ.

පොදු ස්ථාන යන්නට යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් මාවතක හෝ ඒ අවට පොදු බස් නැවතුම් පොළක, රථ ගාලක, වෙළඳ පොළක, පාසැලක, ක්‍රීඩා භූමියක, උද්‍යානයක, පොදු ගොඩනැගිලි පරිශ්‍රයක හෝ මහජනතාවට පොදුවේ ඇතුළු විය හැකි වෙනත් ස්ථානයක යන අර්ථය ද ඇතුළත් වන්නේය.

අයාලේ යන සතුන් යන යෙදුමෙන් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පොදු ස්ථානයක ඇවිදිමින් සිටින, බැඳ සිටින, දිගේලි කර සිටින හෝ වෙන යම් ආකාරයෙන් සිටින සතුන් අදහස් වන අතර බඩු බෑම සහ පැටවීම සඳහා නතර කර තිබෙන කරත්තයකට බැඳ සිටින ගවයෙකු හෝ මී ගවයෙකු ඇතුළත් නොවන්නේය.

බලයලත් තැනැත්තා යනුවෙන් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අයාලේ යන සතුන් අල්ලා තමන් භාරයට ගැනීමත්, ගාලට ගෙන ඒමත් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබුවා වූ ද එම බලය වලංගු ව පවතිනාවූ ද අයෙකු අදහස් වන්නේ ය.

ගාල යනුවෙන් අයාලයේ යමින් සිට අල්ලා ගනු ලබන සතුන් ගාල් කර තැබීම සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පිහිටුවනු ලබන පවත්වා ගෙන යනු ලබන සත්ව ගාලක් හෝ සත්ව ගාල් අදහස් වේ.

රැකවල්කරු යනුවෙන් ගාල හෝ ඒ තුළ ගාල් කර සිටින සතුන් හෝ රැක බලා ගැනීම, පාලනය කිරීම සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලද්දා වූද එම බලය වලංගුව පවතින්නා වූද අයෙකු අදහස් වන්නේ ය.

*උපලේඛන අංක 01*

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

1. අල්ලාගත් සතුන්/සතා පිළිබඳ විස්තර :————.
2. අල්ලාගත් ස්ථානය :————.
3. සතාගේ වර්ගය හා සමේ පැහැය ස්වභාවය හා විස්තර :————.
4. රැකවල්කරුට භාර දුන් දිනය හා වේලාව :————.

භාර දුනිමි.
භාරදුන් තැනැත්තාගේ
අත්සන හා නම :
————.

භාර ගතිමි.
රැකවල් කරු,
භාර ගත් තැනැත්තාගේ
අත්සන සහ නම :
————.

01-534/1

---

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය /126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**ප්‍රාදේශීය සභා බල සීමාව තුළ බදු අය කර ගැනීම පිළිබඳ අදාළ තොරතුරු හා වාර වාර්තා ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - යටියන්තොට ප්‍රාදේශීය සභාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වෙළඳ වෘත්තීය සහ කර්මාන්ත සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කර බද්දක්, කුලියක් හෝ වෙන යම් කුමන හෝ ගාස්තුවක් අය කිරීමට අදාළව තොරතුරු හා වාර්තා ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් අය කර ගත හැකි බද්දක්, කුලියක් හෝ වෙන යම් ගාස්තුවක් අය කර ගැනීම සඳහා අදාළ තොරතුරු හා වාර වාර්තා ලබා ගැනීම විධිමත් කිරීම, පාලනය කිරීම හා පවත්වාගෙන යාම මෙමගින් අපේක්ෂා කෙරේ.

3. *(අ)* මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන හෝ කොන්දේසි මෙම *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට වලංගු වන්නේ ය.

   *(ආ)* (මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි අංක 1 උපලේඛනයේ විස්තර වන ව්‍යාපාර - කර්මාන්ත සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. 3(ආ) වගන්තියේ පළ වන උපලේඛනයේ සඳහන් ප්‍රකාර තමා විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ කර්මාන්ත සම්බන්ධයෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන කිසියම් බද්දක්, කුලියක් හෝ වෙන යම් ඕනෑම ගාස්තුවක් අය කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යැයි හැඟෙන යටියන්තොට ප්‍රාදේශීය සභාව මගින් නියම කර ඉල්ලා සිටින ඕනෑම තොරතුරු හෝ වාර්තාවක් ලබා දීමට 01 උපලේඛනයේ සඳහන් වන වෙළඳ හා කර්මාන්තවල නියැලී සිටින සෑම තැනැත්තෙකුම බැඳී සිටින්නේය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු හා වාර්තා පිළිබඳ ලේකම්වරයා දැන්වීමක්, නිවේදනයක් හෝ වෙනත් විධිමත් දැනුවත් කිරීමක් කර, එකී දැනුම් දීමේ දින සිට දින 30 ක් ඇතුළත යටියන්තොට ප්‍රාදේශීය සභාව වෙත තැපෑලෙන්/ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දීමට කටයුතු කළ යුතුය. අතින් ගෙනවිත් භාර දෙන සෑම ලියවිල්ලක්ම යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට භාර දිය යුතු ද වන්නේය.

6. ඉහත සඳහන් වගන්ති ප්‍රකාර දින 30 ක් තුළ සභාව වෙත ලබා දෙන තොරතුරු හා වාර්තා සම්බන්ධයෙන් ලියවිලි ලද බවට යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් කුවිතාන්සියකින් හෝ වෙනයම් ආකාරයකින් සනාථ කිරීම සභාවේ වගකීම වන්නේය.

7. උක්ත දින 30 තුළ අවශ්‍ය තොරතුරු හෝ වාර්තා නොලැබෙන්නේ නම් හා එකී තොරතුරු සභාවට අවශ්‍ය වේ යැයි හැඟේ නම් සභාවේ සභාපතිතුමාගේ හෝ ලේකම්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුට අදාළ වෙළඳකර්මාන්ත වෙත ගොස් අවශ්‍ය වාර්තා හෝ වාර්තා ලබා ගැනීමට ඉල්ලා සිටීමට හෝ පරීක්ෂා කිරීමට මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ඉඩ කඩ සැලසෙන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව *ගැසට් පත්‍රයේ* පළවූ දිනට පසුව ආරම්භ කරනු ලබන ව්‍යාපෘතියක්/කර්මාන්තයක් වූ විට එහි අයිතිකරු හෝ කළමනාකරු විසින් එසේ ආරම්භ කර දින 30 ක් ඉකුත් වීමට පෙර ඒ බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු වන්නේය.

9. අදාළ ස්ථානය පවත්වාගෙන යනු ලැබූ ව්‍යාපාර/කර්මාන්තයන්හි වෙනසක් ඇති වූ විට එකී වෙනස සිදුවී දින 30 ක් ඉකුත්වීමට පෙර ඒ

බව එකී ස්ථාන අයිතිකරු හෝ කළමණාකරු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම් වරයා වෙත දැනුම් දිය යුතු වන්නේය.

10. එකම ස්ථානයක ව්‍යාපාර/කර්මාන්ත හා වෘත්තීන් කිහිපයක් පවත්වාගෙන යන්නේ නම් අදාල තොරතුරු 02 උපලේඛනයේ සඳහන් ආකෘතිය මගින් වෙන් වෙන් වශයෙන් සැපයීම අදාල ව්‍යාපාර/කර්මාන්තකරුගේ වගකීම හා යුතුකම වන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ඉල්ලා ඇති තොරතුරු හෝ වාර්තා නියමිත කාලවකවානු තුළදී ලබා දීමට කටයුතු නොකිරීම පැහැර හැරීම හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වැනි වගන්තිය අනුව නියම කර ඇති දඩයකින්ද වරදකරු කිරීමෙන් පසුවද එම කඩ කිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුවද එම වරද කරනු ලබන සෑම දිනයක් සඳහාම දිනකට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වන වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකටද යටත් විය යුතුයි.

12 *අර්ථ නිරූපනය.-*

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාව" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවද "සභාපති" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ කටයුතු කරන අයද,

"ලේකම්" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරයේ කටයුතු කරන අයද,

"බලය පැවරූ නිලධාරියෙකු" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද අදහස් වේ.

මෙහිදී "පිරිවැටුම" යන්නෙන් කිසියම් වෙළඳ ව්‍යාපාරයක හෝ කර්මාන්තයක සියළු ලැබීම් අදහස් වේ.

"ව්‍යාපාර" යන්නෙන් යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය, සැපයීම හෝ අලෙවිය සිදුකරනු ලබන පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයක් අදහස් වේ.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ විෂය වන්නා වූ ඕනෑම කරුණක් වරින් වර සංශෝධනය කර ගැනීමේ බලය යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත් වල අර්ථය සම්බන්ධයෙන් යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල පිටපත් වලංගුව බල පවත්වන්නේ ය.

**අංක 01 උපලේඛනය**

* ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝ හෝටල් ආපන ශාලා හෝ නවාතැන් පොලවල්
* ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් අනුමත කරන ලද විදුලි බලාගාර
* කර්මාන්ත ශාලා
* ඇඟලුම් කම්හල්
* විදේශ රැකියා නියෝජිත ආයතන
* සුපිරි වෙළඳසැල්
* ලියාපදිංචි මත්පැන් හල්
* පෞද්ගලික ප්‍රවාහන සේවා ආයතන
* රිය පැදවීම පුහුණු කරන ආයතන
* මුදල් තැන්පත් කිරීම ණයට දීම සිදු කරනු ලබන සියළුම මූල්‍ය ආයතන
* රක්ෂණ ආයතන
* විගණන ආයතන
* පුද්ගලික වෛද්‍ය පරීක්ෂණාගාර
* ස්වාධීන කොන්ත්‍රාත්කරු ආයතන
* වෙන්දේසි හා බ්‍රෝකර්වරු
* මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්
* කොන්ක්‍රීට් වැඩපලවල්
* ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කර ඇති වෙනත් සියළුම ව්‍යාපාර

**අංක 02 උපලේඛනය**

1. අයිතිකරුගේ නම :—————.
2. ජාතික හැඳුනුම් පත් අංකය :—————.
3. ලිපිනය :—————.
4. ව්‍යාපාරික ස්ථානයේ වාර්ෂික වටිනාකම
   (i) තක්සේරු අංකය :—————.
   (ii) පසුගිය වාර්ෂික පිරි වැටුම/ලැබීම් (විස්තර) :—————.
5. ව්‍යාපාරයේ/කර්මාන්තයේ/වෘත්තියේ ස්වභාවය :—————.
6. ව්‍යාපාරයේ/කර්මාන්ත විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා කර්මාන්තයක් නම් නිපදවනු ලබන භාණ්ඩ (විස්තර පසු පිටේ සඳහන් ව ඇත) :—————.
7. සේවයේ නියුතු සේවක සංඛ්‍යාව :—————.
8. ව්‍යාපාර/කර්මාන්ත/වෘත්තීය වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් යටතේ ලියාපදිංචි වී ඇත්නම් විස්තර :—————.
9. වෙනත් :—————.

ඉහත මවිසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අසත්‍යයෙන් තොර බවත් සහතික කරමි.

—————,
අත්සන,
(ව්‍යාපාර/කර්මාන්ත/වෘත්තීය) අයිතිකරු.

දිනය :—————.

01-534/2

---

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන

මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

අතුරු ව්‍යවස්ථාව

***ඓතිහාසික ස්ථාන, ස්වාභාවික හා දර්ශනීය ස්ථාන නැරඹීම විධිමත් කිරීම පාලනය කිරීම, ආරක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභාව***

1. මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික ස්ථාන, ස්වාභාවික හා දර්ශනීය ස්ථාන නැරඹීම සහ විධිමත් කිරීම, පාලනය කිරීම, ආරක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වන්නේය.

2.1 මෙහි 1 වන උපලේඛනයේ දැක්වෙන ස්ථාන නැරඹීම සඳහා වාහනයකින් ඇතුළුවීම හෝ වෙන් කර ඇති ස්ථාන වල වාහන ගාල් කිරීම පිණිස යටියන්තොට ප්‍රාදේශීය සභාවේ නාමය සහිත මුද්‍රාව යෙදූ මෙහි 2 වන උපලේඛනයේ දැක්වෙන නිශ්චිත ගාස්තු ගෙවා ලබාගන්නා ලද ප්‍රවේශ පත්‍රයක් දරන්නේ නම් මිස ඇතුලුවීම නොකලයුතු වන්නේය.

2.2. මෙම අතුරු ව්‍යවස්ථාවේ 02 වන උපලේඛනයේ සඳහන් ගාස්තු අවශ්‍යතාවය අනුව වරින්වර සංශෝධනය කර ගැනීමේ බලය යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

3. i. ඓතිහාසික හෝ ස්වාභාවික දර්ශනීය ස්ථානවල ගහ කොලකට, ඓතිහාසික වැදගත් කමක් ඇති වස්තුවකට, ගල් කුලකට, හානි පැමිණවීම හෝ නම් ගම් ලිවීම හෝ රූ සටහන් ඇඳීමෙන් විකෘති නොකලයුතු වන්නේය.

ii. එසේ වුවහොත් නීතිය හමුවට පැමිණීම අදාල අලාභය සම්බන්ධව වගකිවයුතු පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායමෙන් අය කිරීමට යටත් විය යුතු වන්නේ ය.

4. පොලිතීන්, ප්ලාස්ටික් ද්‍රව්‍ය ලෝහ භාජන, බෝතල්, බෝතල් කටු, රෙදි කැබලි බෑග් හෝ වෙනත් අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් තබා ඇති කසල භාජන වලට හෝ වෙන්කර ඇති ස්ථානවලට පමණක් බැහැර කිරීම කලයුතු වන්නේ ය.

5. කිසියම් ආකාරයකින් ඉහත කී ස්ථානයන්හි ඇති ජල මූලාශ්‍රයන්ට හෝ ඇල දොල ගංගා ආදී ජල මාර්ගයන් අපවිත්‍ර කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, බීමත්ව අශෝභන ලෙස හැසිරීම හෝ වෙනත් නරඹන්නන්ට හිරුහැර හෝ බාධා නොවන පරිදි ක්‍රියා කිරීම කිසිදු අයුරකින් නොකලයුතු වන්නේ ය.

6. 01 උපලේඛනයේ දැක්වෙන ඓතිහාසික - ස්වාභාවික හා දර්ශනීය ස්ථාන ඇතුළත් කරමින් වීඩියෝ දර්ශන හෝ සිනමා දර්ශන රූපගත කරන්නේ නම් ඒ සඳහා 3 වන උපලේඛනයේ ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු වන්නේ ය.

7. නියමිත ගාස්තු ගෙවා විධිමත් ප්‍රවේශ පත්‍රයක් ලබාගෙන තිබේදැයි පරික්ෂා කිරීම, සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට, නියෝජිතවරයන්ට, ලේකම්වරයාට හෝ බලය පැවරූ ඕනෑම නිලධාරියෙකුට කළ හැකි වන්නේ ය.

8. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ පූර්ව අනුමැතියක් මත බල ප්‍රදේශයේ පදිංචි විශේෂ අනුග්‍රාහක ලැබිය යුතු අයගේ වාහන ගාස්තු වලින් නිදහස් කළ හැකි වන අතර පාසැල් ළමුන් හෝ වෙනත් අධ්‍යාපන චාරිකා සඳහා පැමිණෙන්නන්ද ලිඛිත ඉල්ලීම් මත ගාස්තු වලින් නිදහස් කළ හැකි වන්නේ ය.

9. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක වලංගු කාලය පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා වන අතර ඉන් පසු අදාල භූමියේ රැඳී සිටීම කණ්ඩායමක් ලෙස එක් රැස්වී සිටීම හෝ තහනම් වන අතර අදාල කරුණ සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට එවැනි පුද්ගලයන් හෝ කණ්ඩායම් අදාල භූමියෙන් ඉවත් කිරීමට හෝ නීතිය හමුවට පැමිණ වීමට බලය ඇත්තේ ය.

10. වලංගු කාලයෙන් පසු ඉහත කී බලපත්‍රය මගින් වලංගු ස්ථානයක වීඩියෝ කිරීමට ඡායාරූපගත කිරීමට හෝ වෙනත් ආදල කාර්යයන් සඳහා රැඳී සිටීම අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් පූර්ව ලිඛිත අවසරයක් ලබාගත යුතුය.

11. අතුරු ව්‍යවස්ථාව බලාත්මක වන ඕනෑම ස්ථානයකට කුමන හෝ වර්ගයක මත්පැන් රැගෙන ඒම හෝ එම ස්ථානයක සිට මත්පැන් පානය කිරීම නොකළ යුතු වන්නේ ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක වන ස්ථානයක අනාරක්ෂිතභාවය, තම නොසැලකිලිමත්භාවය හෝ බීමත්කම හේතු කොට ගෙන කවර හෝ අනතුරකට ලක්වුවහොත් ප්‍රාදේශීය සභාව ඒ සම්බන්ධයෙන් වගකීමෙන් නිදහස් විය යුතු අතර අදාල ස්ථාන නැරඹීමට යාමේදී නරඹන්නාගේ ආරක්ෂාව නරඹන්නා විසින්ම තහවුරු කර ගත යුතුය.

13. මෙහි 1 වැනි උපලේඛනයේ දැක්වෙන ස්ථාන නැරඹීමේදී එම ස්ථාන වල ජීවත් වන කිසිදු සතෙකුට හිංසාවක්, පීඩාවක් හෝ වෙනත් කරදරයක් සිදු නොවන ආකාරයට හැසිරීමට සෑම තැනැත්තෙකුම වග බලා ගත යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි උපලේඛනය යටතට ගැනෙන කිසිදු ස්ථානයක අසභ්‍ය, අශ්ශීල, දුරාචාර ලෙස ගැනෙන කිසිදු හැසිරීමක් නොකල යුතු අතර එවැනි නිරූපණයන්ද නොකළ යුතු වන්නේ ය.

15. මෙම ව්‍යවස්ථාව යටතේ සඳහන් කර ඇති භූමි භාගයන් තුළ පිහිටි පුරාවිද්‍යාත්මක හෝ කෞතුක හෝ සමාජ විද්‍යාත්මක වටිනාකමක් හා අගයක් ඇති ස්ථාන නැරඹීමේදී ඒවා වෙන් කර ඇති සීමා මායිම් වලින් පිටත පමණක් සිටීමට වග බලා ගත යුතු වන්නේ ය.

16. මෙම ව්‍යවස්ථාවේ 1 වැනි උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි සභාව මගින් ප්‍රදර්ශනය කර ඇති මඟ පෙන්වීමේ උපදෙස් හා අවවාද තරයේ පිළිපැදීමට සෑම තැනැත්තෙකුම වග බලා ගත යුතු වන්නේ ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර නිසි අධිකරණ බලය ඇති අධිකරණයකදී වරදකරු කරනු ලැබීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වැනි වගන්තිය අනුව නියම කර ඇති දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එම උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විට නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින්

සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වන වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දණ්ඩනයකට යටත්වනු ලබන්නේය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස සභාපති යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, සභාපතිවරයා විසින් බලය පැවරූ නිලධාරියා යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් ද ආදායම් පරිපාලක හෝ බලය පැවරූ සභාවේ වෙනත් ඕනෑම නිලධාරියෙකු ද අදහස් වේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථ නිරූපනය සම්බන්ධයෙන් යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගුව බල පවත්වන්නේ ය.

1 උපලේඛනය

(i.) කිතුල්ගල කුරුළු පාරාදීසය
(ii) කිතුල්ගල බෙලිලෙන
(iii) වීඔය - තෙප්පුකුලම

2 උපලේඛනය

පයින් ගමන් කරන්නන් සඳහා

| | | |
|---|---|---|
| දේශීය මුදල | - | රු. 20.00 |
| විදේශීය මුදල | - | රු. 100.00 |

වාහන ගාල් කිරීමේ ගාස්තු

| | | |
|---|---|---|
| ආසන 15 මිනී බස්රථ හා වෑන් | - | රු. 100.00 |
| ආසන 15 ට වැඩි බස් රථ, ලොරි | - | රු. 200.00 |
| කාර් රථ සඳහා | - | රු. 50.00 |
| ත්‍රීවිලර් රථ සඳහා | - | රු. 30.00 |
| මෝටර් සයිකල් හා පාපැදි | - | රු. 20.00 |

3 වැනි උපලේඛනය

| | | |
|---|---|---|
| (i) | ඕනෑම දර්ශන හා ටෙලිනාට්‍ය දර්ශණ වෙනුවෙන් දින 01 සඳහා | රු. 1,000 0 |
| (ii) | වෙළඳ දැන්වීම් ප්‍රදර්ශන ගත කිරීම සඳහා 01 සඳහා | රු. 50 0 |
| (iii) | අත් කැමරා රැගෙන යාමේ ගාස්තු | රු. 20 0 |
| (iv) | අත් වීඩියෝ රැගෙන යාමේ ගාස්තු | රු. 50 0 |

01-534/3

---

යටියන්තොට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය /126 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - යටියන්තොට ප්‍රාදේශීය සභාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සභා මාර්ග වල ධාවනය වන වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මාර්ග යනුවෙන් ප්‍රකාශයට පත්කොට ඇති හා වෙනත් අධිකාරියකට අයත් නොවන්නා වූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි මාර්ග වල බර වාහන ගමනා ගමනය විධිමත් කිරීම පාලනය කිරීම, ධාවන වේගය හා බර සීමාවන් පැනවීම හා මාර්ග වලට වන හානිය අවම කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

03 (1) මින් මතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද, පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තු ගෙවා ලබා ගන්නා ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස ඉහත දෙවන වගන්තියෙන් අර්ථ දැක්වෙන මාර්ගයක බර ටොන් 2 වඩා වැඩි වන්නා වූ ටිපර් රථයක්, ලොරි රථයක්, ට්‍රැක්ටරයක් මාර්ග ඉදිකිරීම් යන්ත්‍රයක්, ධාවනය කිරීම හෝ ගල් වැලි ආදී සියලු ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් ඛණිජ ද්‍රව්‍ය හෝ තේ දළු හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම හෝ නොකල යුතු වන්නේය. මෙහි දෙවන වගන්තියේ සඳහන් මාර්ගය මතින් හෝ ට්‍රැක්ටරයක් මගින් දැව කඳන් හෝ වෙනත් ද්‍රව්‍ය ඇද්දවීම හෝ ඇදගෙන යාම නොකළ යුතු වන්නේ ය.

03. (2) වායු පීඩන ටයර් රහිත කිසිදු වාහනයක් වෙනත් වාහනයක පටවා මිස ප්‍රාදේශීය සභාවේ කිසිදු මාර්ගයක ධාවනය කිරීම නොකළ යුතු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක ධාවනය කළ හැකි උපරිම සීමාව පැයට කි. මී. 25 ක් නොඉක්මවිය යුතුය.

05. කිසියම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන වගන්තියෙන් අර්ථ නිරූපනය වන මාර්ගයකින් මෙම ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයෙන් දෙවන කොටසේ සඳහන් ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවේ සභාපති වෙත යටත් පිරිසෙයින් සතියේ වැඩ කරන දින 03කටවත් පෙර ඉදිරිපත් කළ යුතුය.

05. (2) ඉහත 5.1 අනු වගන්තිය අනුව ඉල්ලීමක් ලැබුණු කල්හි සභාපතිවරයා විසින් කාර්මික නිලධාරි හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවා නියමිත ගාස්තු හා හානි විය හැකි ප්‍රමාණයට ප්‍රමාණවත් වන ඇප තැන්පත් මුදලක් ලබාගත යුතු වන්නේ ය.

5(3) ඉහත 5.2 අනු වගන්තිය යටතේ ඇප මුදල් හා නියමිත ගාස්තු අය කිරීමෙන් පසු ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මිස අදාළ අවසර ලබා නොදිය යුතුය.

5(4) ඉහත 5.3 අනු වගන්තිය යටතේ ලබා ගනු ලබන ඇප තැන්පත් මුදල නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමක් ලද විට ප්‍රථමයෙන් 10% ක දෙපාර්තමේන්තු ගාස්තු ද අනතුරුව හානියක් වී ඇතොත් එකී අලාභය ද තක්සේරු කර අය කර ගත යුතුය.

5(5) හානිය, ඇප තැන්පත් මුදල, ඉක්මවා යයි නම් එම අතිරේක මුදල ද ගෙවන ලෙස අදාල පුද්ගලයාට නියම කිරීම නීත්‍යානුකූල වේ. එසේම හිඟ මුදල ගෙවන ලෙස නියම කර ඇති අවස්ථාවකදී ගෙවීම් පැහැර හරින්නේ නම් නිසි අධිකරණ බලය සහිත අධිකරණයක නඩු පවරා හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේය.

5(6) 5(5) අනු වගන්තිය යටතේ කටයුතු කිරීමට පෙර සහනදායී ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම යෝග්‍ය යැයි සභාවේ සභාපතිවරයාට හැගෙන අවස්ථාවක ඒ බව ප්‍රාදේශීය සභාවේ මහා සභාව වෙත ඉදිරිපත් කර ලබා ගන්නා තීරණය අනුව එකී සහන ප්‍රදානය කිරීමේ බලය සභාවේ සභාපතිවරයා සතුවන්නේය.

6. ප්‍රාදේශීය සභාව සමග සංවර්ධන කටයුතුවලට අදාල ගිවිසුම්වලට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන් විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම් මගින් මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ගාස්තුවලින් නිදහස් කර ගත හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බල පත්‍රයක්ම පරීක්ෂා කිරීමේ බලය පොලිස් නිලධාරියෙකු, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරණ වෙනත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කිරීම නිත්‍යානුකූල වන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩ කිරීමක්ම වරදක්වන අතර කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වැනි වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද, වරදකරු කිරීමෙන් පසුව ද එම කඩ කිරීම දිගින් දිගටම කර ගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව ද, ඒ වරද කර ගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වැනි වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථ නිරූපණයේ දී යම් අපැහැදිලිතාවයක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවසථාවකම බලාත්මක විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා "ප්‍රාදේශීය සභාව" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව ද, "සභාපතිවරයා" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, "ලේකම්" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාද වෙනත් බලය පවරන ලද නිලධාරියෙකු යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියෙකු ද පොලිස් නිලධාරියෙකු යන්නෙන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් නිලධාරියෙකු ද අදහස් වේ.

### පළමු උපලේඛනය

1. ගල්, වැලි, ඇතුලු ගොඩනැගිලි ද්‍රව්‍ය, පස්, වෙනත් ඛනිජ ද්‍රව්‍ය රබර් ආශ්‍රිත නිෂ්පාදන හා තේ දළු ප්‍රවාහනය.

| *කාලය* | *මුදල* |
|---|---|
| | රු. ශත |
| මාස 01 ක් සඳහා | 100 0 |
| කාර්තු 01 ක් සඳහා | 275 0 |
| වාර්ෂිකව | 1,000 0 |

2. දර, උණ දඬු හා දැව කඳන් ප්‍රවාහනය

| | |
|---|---|
| ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වරකට | 100 0 |
| ලොරි, ටිපර්, ට්‍රක් රථයක් එක ගමන් වාරයකට | 200 0 |
| ඇතුන් ලවා දැව කඳන් ඇද්දවීම එක් දිනකට | 500 0 |

### දෙවන උපලේඛනය

රථ වාහන නවතා තැබීමේ ස්ථාන, වේලාව හා දින

| *ස්ථානය* | *දිනය* | *වේලාව* |
|---|---|---|
| ඔරලෝසුව කණුව අසල සිට ජනසිරි ස්ටෝර්ස් දක්වා | ඉරට්ටේ දිනවල | පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා |
| මහජන බැංකුව ඉදිරිපිට | ඔත්තේ දිනවල | පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා |
| ජනසිරි ස්ටෝර්ස් සිට ලංකා බැංකුව දක්වා වම් පස | දිනපතා | පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා |
| පරුස්සැල්ල පාර-කැළණිවැලි ට්‍රේඩ් සෙන්ටර් අසල සිට සමුපකාරය - දකුණුපස | දිනපතා | පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා |

01-534/4

---

### යටියන්තොට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය 1/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව

පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත බලාත්මකවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,<br>
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,<br>
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,<br>
සබරගමුව පළාත් සභාවේ දී ය.

**බොරළු, කළුගල්, සිමෙන්ති හා වැලි ආශ්‍රිත කර්මාන්ත ස්ථාන විධිමත් කිරීම පවත්වා ගෙන යාම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත විධිමත් කිරීම හා පාලනය කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. යටියන්තොට ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංක 01 වගන්තියේ සඳහන් යම් කර්මාන්තයක් පවත්වගෙන යන්නේනම්, හෝ පැවැත්වීමට ක්‍රියා කරන්නේ නම් හෝ එකී කර්මාන්ත ඇත්තේ යම් මාවතක්, වීදියක් අයිනේ හෝ යම් යාබද නිවසක, ඉඩමක හෝ පරිශ්‍රයක නම් කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්තයේ අයිතිකරු, පදිංචිකරු හෝ බදු කරු විසින් (මෙහි මින් මතු සභාපතිවරයා වශයෙන් සඳහන් කරනු ලබන) යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සහ ඔහු විසින් විධානය කරන ආකාරයට මිස අංක 01 වගන්තියට අදාල කර්මාන්තය පවත්වාගෙන නොයා යුතුය.

03. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්තයන්ට අදාල කුමන ආකාරයේ හෝ ඉදිකිරීමක්, අළුත් වැඩියාවක් හෝ වෙනස් කිරීමක් සභාවේ අනුමැතිය රහිතව සිදු නොකල යුතුය.

04. කළුගල්, සිමෙන්ති වැලි, හා බොරළු ආශ්‍රිත කර්මාන්ත සඳහා නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස අවසර පත්‍රය අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 දින දක්වා බල පවත්වන්නේ ය.

05. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත සඳහා වාර්ෂික අවසර පත්‍රය එකී වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම ලබා ගත යුතු වන අතර අළුතින් ආරම්භ කරනු ලබන කර්මාන්තයක් වේ නම් ආරම්භ කර දින 30 ක් ඇතුලත අවසර පත්‍රය ලබා ගත යුතු වන්නේය. කළුගල් සිමෙන්ති වැලි හා බොරළු ආශ්‍රිත කාර්මාන්තයන්ට අදාල කුමන හෝ ආකාරයේ ඉදිකිරීමක් අලුත් වැඩියාවක් වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා සභාවේ නිසි අනුමැතිය ලබා ගත යුතු වන්නේ ය.

06. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත සඳහා අදාළ සෑම අවසර පත්‍රයක්ම නිකුත් කිරීම යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් කලින්කල පනවනු ලබන ගාස්තුවලට හා නියමයන්ට යටත් විය යුතුය.

07. මෙහි මින් මතු දැක්වෙන කොන්දේසිවලට අනුකූල නොවන්නේ නම්, මෙම අතුරු ව්‍යවස්ථාවට විෂය වන්නා වූ කිසිදු කර්මාන්තයක් සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොලැබෙන්නේය.

i. අදාල කර්මාන්තය සඳහා වෙළඳ බලපත්‍රය හා පරිසර බලපත්‍රය ලබා තිබිය යුතුය.

ii. කළුගල්, සිමෙන්ති,වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්තවල අමුද්‍රව්‍ය හා නිෂ්පාදන, පැටවීම, බෑම, ගබඩා කිරීම කිසිදු මංමාවතකට, වීදියකට පෞද්ගලික මාර්ගයකට කිසිදු ආකාරයේ හානියක් හෝ අවහිරයක් නොවන පරිදි සිදු කල යුතුය.

iii. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත ස්ථාන ගත කිරීමේ දී වෙනත් ලිඛිත නීතියකින් අවම දුර ප්‍රමාණය පිළිබඳ විධි විධානයන් නියම කර නොමැත්තේ නම් මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මකවන දින සිට පූජනීය ස්ථාන, රෝහල්, අධිකරණ පරිශ්‍ර, පාසැල් රක්ෂිත වනාන්තර, පානීය ජල මූලාශ්‍ර වල සිට මී. 200 ඇතුලත් නොවිය යුතුය.

iv. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්තය පිහිටි ගොඩනැගිල්ල සභාව විසින් අනුමත කරන පිරිවිතරයන්ට අනුකූලව ඉදිකර තිබිය යුතුය.

v. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්තවල සේවා නියුක්තිකයින්ගේ ශරීර සෞඛ්‍යයට හානි නොවන පරිදි සෞඛ්‍යාරක්ෂිත අත් ආවරණ, පාවහන් සහ හිස් වැසුම් අවශ්‍ය පරිදි සපයා දිය යුතුය.

vi. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත තුළ අප ජලය හා අප ද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීමේ ක්‍රම යොදා තිබිය යුතුය.

08. අංක 07 වැනි වගන්තියේ සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් හෝ කොටසක් හෝ සියල්ලම හෝ උල්ලංඝනයවන අවස්ථාවල දී අවසර පත්‍රය අහෝසි කිරීමේ බලය යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වන්නේය.

09. කළුගල්, සිමෙන්ති, වැලි හා බොරළු ආශ්‍රිත කර්මාන්ත පරිශ්‍රයට ඕනෑම අවස්ථාවක ඇතුළු වී පරීක්ෂා කිරීමේ හා මිණුම් ගැනීමේ බලය මෙම යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය පවරනු ලබන ඕනෑම නිලධාරියෙකු සතු වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කිසියම් විධි විධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වැනි වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද, වරදකරු කිරීමෙන් පසුව ද එම කඩ කිරීම දිගින් දිගටම කර ගෙන යනු ලබන්නේ නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව ද, එම වරද කර ගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වැනි වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ විෂය වන්නා වූ ඕනෑම කරුණක් වරින් වර සංශෝධනය කර ගැනීමේ බලය යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාපති" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය දරනු ලැබූ තැනැත්තා ද, "ලේකම්" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරයේ කටයුතු කරන තැනැත්තා ද "සභාව" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව ද හඳුන්වනු ලබන්නේය.

13. මෙකී අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල නොගැලපීමක් ඇති වුවහොත් යම් අවස්ථාවක දී සිංහල පිටපත බල පවත්වන්නේය.

01-534/5

---

**කෑගල්ල නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 94 වැනි වගන්තිය/157 වැනි වගන්තිය යටතේ නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර කෑගල්ල නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී නගර සභා ආඥා පනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කෑගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුලත බලාත්මක වන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පාලනය කිරිමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කෑගල්ල නගර සභා බලප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. 1963 මාර්තු මස 22 වැනි දින අංක 13570 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද කෑගල්ල නගර සභා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අවලංගු වේ.

03. කිසිවෙකු විසිනුත් නගර සභා බල ප්‍රදේශය තුළ සභාපතිවරයාගේ අවසරපත්‍රයක් නොලබා කිසිදු ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කරවීම හෝ නොකළ යුතු වන්නේ ය. අවසර පත්‍රයක් ලබාගැනීමට අදහස් කරන සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i. කෑගල්ල නගර සභාව මගින් නිකුත් කරනු ලබන නියමිත අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය. (මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව විය යුතුය.)

ii. එම අයදුම්පත දැන්වීම් ප්‍රදර්ශනයට හෝ ප්‍රචාරයට දින 07කට පෙර ඉදිරිපත් කළ යුතුය. එහෙත් විශේෂ හේතුවක් මත සභාපතිවරයාගේ අභිමතය පරිදි මෙම නියමය ලිහිල් කළ හැකි වන්නේ ය.

iii. සෑම අයදුම් පත්‍රයක් සමගම මෙහි පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කර තිබිය යුතුය.

(අ) ප්‍රචාරක දැන්වීම හෝ පුවරුව සවිකරන ස්ථානයේ, භූමියේ අයිතිකරුගෙන් කැමැත්ත ලබාගත් ලිපිය.

(ආ) භූමියේ අයිතිකරු තහවුරු කිරීම සඳහා නගර සභාව විසින් ඉල්ලුම් කරන ලියවිලි.

(ඇ) දැන්වීම් සවිකිරීමට ආකෘතියක් ඇත්තේ නම්, එය සාදා ඇති ද්‍රව්‍ය, දිග, පළල, පොළවේ සිට උස අඩි/මීටර් ප්‍රමාණය සඳහන් කරන ලද සැලැස්මක්.

(ඈ) ප්‍රචාරය කරන දැන්වීමට සාකල්‍යයෙන්ම සමාන වචන, චිත්‍ර/පාට, දිග, පළල, උස සඳහන් ආකෘතියක්.

(ඉ) දැන්වීමේ සඳහන් කරුණුවල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා නගර සභාව විසින් ඉල්ලා සිටින ලියවිලි.

04.3 වැනි අතුරු ව්‍යවස්ථාව පරිදි ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක මෙම අවස්ථාවේ 3 වැනි උපලේඛනයේ සඳහන් ගාස්තු අයදුම්කරු විසින් සභාවට ගෙවා කුවිතාන්සි ලබාගන්නා ලෙස සභාපතිවරයා විසින් විධිවිධාන කළ යුතුය. මෙම සභාවේ යෝජනා සම්මතයක් මගින් කලින් කල තීරණය කරනු ලැබූ *ගැසට් පත්‍රයේ* පළකර ප්‍රසිද්ධ කිරීමෙන් මෙම ගාස්තු ප්‍රමාණ සංශෝධනය කිරීමට සභාවට බලය ඇත්තේ ය.

05. අයදුම්කරුගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි වන සේ පැහැදිලි අකුරින් එම දැන්වීම් පුවරුවේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ආකෘතියෙහි හෝ ඉදිරිපසින් හොඳින් පෙනෙන ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

06. යම් තැනැත්තෙකු ප්‍රචාරක දැන්වීමක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කළ විට සභාපති විසින් ඒ තැනැත්තාට,

i. එම ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම ඒ සඳහා නිකුත් කර ඇති අවසර පත්‍රයේ දිනය හා අංකය සඳහන් කරන ලෙස හෝ,

ii. ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම ඒ දැන්වීම සඳහා වූ අවසර පත්‍රයට ගාස්තු ගෙවා ඇති බව සඳහන් කිරීම සඳහා මුද්‍රා තැබීමට සභාපති වෙත ඉදිරිපත් කරනු ලැබීමට කටයුතු සලස්වන ලෙස හෝ නියම කළ හැකිය.

07. යම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා වූ අවසර පත්‍රය වෙනුවෙන් ගාස්තු ගෙවූ බව සනාථ කිරීමට සභාපති විසින් එම දැන්වීමේ තබන ලද යම් මුද්‍රාවක්, සංකේතයක්, අකුරක්, වචනයක්, රූපයක් විකෘති කිරීමෙන් හෝ විකෘති කිරීමට සැලැස්වීම කිසිවෙකු විසින් නොකළ යුතුය.

08. i. යම් ප්‍රචාරක දැන්වීමක් දුර්වර්ණවීම හෝ අප්‍රසන්න වීම හෝ වන අවස්ථාවක කෑගල්ල නගර සභාව විසින් නිකුත් කරනු ලබන ලිඛිත නිවේදනයක් මගින් බලපත්‍රයේ කාලසීමාව ඉක්මවා යාමට පෙර එම දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කළ හැකි වන්නේ ය.

ii. මේ අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදය යටතේ නිවේදනයක් කෑගල්ල නගර සභාව විසින් භාරදෙනු ලබන කවර හෝ තැනැත්තෙකු විසින් නම් කොට දැක්වෙන කාලය ඇතුලත එම නිවේදනය අනුව ක්‍රියාකල යුතු වන්නේ ය.

09.02 වැනි උපලේඛනයේ දැක්වෙන වර්ගයේ ප්‍රචාරක දැන්වීම් කිසිවක් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබාගැනීමට අයත් නොවන්නේ ය.

10. යම්කිසි දුම්වැටි හෝ මත්පැන් ප්‍රචාරක දැන්වීමක්, පුවරුවක්, තාප්පයක, බිත්තියක, ඇඳ තැබීමක්, ප්‍රදර්ශනය කිරීමක් නොකල යුතු වන්නේ ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීමක් හෝ නොකර හැරීමත් වරදක් වන අතර, කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට සහ එකී උල්ලංඝනය තව දුරටත් නොකඩවා කරනු ලබන සෑම අවස්ථාවකම 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 153 (2) උප වගන්තියෙන් නියම කර ඇති දඩයකට යටත් වන්නේ ය.

12. (අ) කිසිම තැනැත්තෙකු විසින්,

i. යම් වීදියක හෝ අඩි පාරක හෝ රිය මගකට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයට ප්‍රදර්ශනය කිරීම

ii. පොලවේ සිට මීටර් 10ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම,

iii. යම් වීදියක හෝ පාරකට මුහුණ ලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමා ඉක්මවා යන දිගකින් යුත්, ප්‍රචාරක දැන්වීමක් සවිකොට හෝ එල්ලා තැබීම පුද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලකට, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාලමක හෝ මගී පාලමක හෝ දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු වන්නේ ය.

(ආ) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා අයිතිකරු හෝ බදුකරු විසින්,

i. එම පුවරුව නිසි අලුත්වැඩියාවෙන් යුතුව මහජනයාගේ දේපල වල ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය.

ii. එම දැන්වීමෙහි ප්‍රකටව පෙනෙන පරිදි හා කියවිය හැකි පරිදි පැහැදිලිව දැන්වීම්කරුගේ නම සහ ලිපිනය සඳහන් කර තිබිය යුතුය.

(ඇ) i. කිසිම තැනැත්තෙකු විසින් අනුමත කර ඇති ආකාරයට හෝ ආකෘතියෙහි නොවන කිසි ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමත්,

ii. පොලිස් අධිකාරිවරයා විසින් අනුමත කර ඇති ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් නොවන වෙනත් ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සහිත වාහන යම් වීදියක හෝ පාරක පැදවීමට සැලැස්වීම නොකල යුතුය.

13. අවසර පත්‍රයක් නොගෙන කෑගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන (02 වන උපලේඛනයේ දැක්වෙන ප්‍රචාරක දැන්වීම් හැර) සියළු ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමේ බලය සභාව සතු වන්නේ ය. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට තිබිය දී වුව ද යම් අයුරකින් සවිකරන ලද බිත්තියක හෝ තාප්පයක බැනරයක්, කටවුට් එකක්, ප්‍රචාරක දැන්වීමක හෝ පුවරු හෝ සුළඟට ඇල වී හෝ ගැල වී හෝ බිම ඇද වැටී හෝ නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ හානියක් වේ නම්, එබඳු දැන්වීම් ප්‍රදර්ශනය කරන්නා විසින් යථා පරිදි සකස් කිරීමට අපොහොසත් වුවහොත්, සභාපති විසින් ඉවත් කරවිය හැකිය. (දැන්වීම ඉවත් කිරීමට කටයුතු කළ හැකි වන්නා සේම, එම දැන්වීම පිළිබඳ කිසිම වගකීමකට හෝ අලාභයක් ගෙවීමට සභාව හෝ සභාපතිවරයා හෝ යටත් නොවේ.)

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාව" යන්නෙන් කෑගල්ල නගර සභාව ද, "සභාපති" යන්නෙන් කෑගල්ල නගර සභාවේ සභාපති ද "ලේකම්" යනු කෑගල්ල නගර සභාවේ සභාපතිවරයාගේ ලිඛිත බලයලත් නියෝජිතයා ද වේ.

දැන්වීම් පුවරුව යන්නෙන් අදහස් වන්නේ යම් නිර්මිතයක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, බිත්ති ප්‍රදර්ශනයක පුවරුවක් හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා උපයෝගී කරගන්නා වෙනත් කවර හෝ උපක්‍රමයක් අදහස් වේ. තව ද ගුවන් පුවරුව යන්නෙන් අදහස් වන්නේ, යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් නිර්මිතයකට ඉහලින් හෝ ඒ මත යම් කණුවකට, රිටකට, ස්ථම්භයකට, රාමු තට්ටුවකට හෝ වෙනත් ආධාරකයකට සවිකර ඇති හෝ ඒ මත රඳවා ඇත්තා වූ ද යම් වීදියක, පාරක, ඇලක, හෝ වැවක යම් ලක්ෂයක සිට අහස පසුතලය වශයෙන් ඇතිව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දෘශ්‍යමානව ඇත්තා වූ ද, ප්‍රචාරක කාර්යය සඳහා උපයෝගි කරගන්නා වචනයක්, අක්ෂරයක්, අනුරුවක්, සලකුනක්, උපක්‍රමයක් හෝ නිරූපනයක් ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉංග්‍රීසි, දෙමළ, පිටපත්වල අර්ථ නිරූපනයේ දී යම් අපැහැදිලි තැනක් වුවහොත්, සිංහල භාෂාවෙන් ඇති අතුරු ව්‍යවස්ථාව වලංගු වන්නේ ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පලකල දින සිට වලංගු වන්නේ ය.

**01 වැනි උපලේඛනය**

01. අයදුම්කරුගේ නම :—————.

02. ස්ථිර ලිපිනය :—————.

03. දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන වෙළඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළඳ ද්‍රව්‍ය පිලිබඳ විස්තර :—————.

04. දැන්වීම ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන :—————.

05. දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කාලය :—————.

අදාල වන අනෙකුත් පාර්ශ්ව වල එකගතා ලිපි අමුණා තිබේ ද? :—————.

06. අදාල ආකෘතිය අමුණා තිබේ ද? :—————.

07. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර) :—————.

08. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු වුව ද, දැන්වීම දුර්වර්ණ වීම, ගැලවීම, ඇලවීම, කඩා වැටීම වුවහොත්, යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද යන්න. :—————.

09. ප්‍රදර්ශනයට අවසර දී ඇති කාලය ඉක්ම වූ පසු තමා විසින් ම එම දැන්වීම/පුවරුව ඉවත් කර ගන්නේ ද? :—————.

(ඉවත්කර නොගන්නේ නම්, සභාවෙන් ඉවත් කිරීමට ගාස්තු අයකරනු ලැබේ)

10. සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් බව ද හොඳාකාරවම මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

### 02 වන උපලේඛනය

පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අදාල නොවන්නේ ය.

i. ආගමික හා පූජ්‍ය ස්ථාන වලට අයත් දැන්වීම්
ii. ආරක්ෂක සේවාවන්ට සම්බන්ධ දැන්වීම්
iii. පොදු කටයුතු සඳහා රජයේ මැදිහත්වීම යටතේ සියළුම දැන්වීම්
iv. අවමංගල්‍ය දැන්වීම්, දේශපාලන හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්
v. තමාගේ වෙළඳසැල තුල/මත තිබෙන නාම පුවරු/ගෘහ නාම පුවරු
vi. ''කුලියට දීමට තිබේ'' යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්
vii. ''විකිණීමට තිබේ'' යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්
viii. වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන වර්ග ප්‍රමාණය වර්ග අඩි 04ක් නොඉක්මවන නාම පුවරුවක්

### 03 වන උපලේඛනය

| | *මාසයක් ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියකට ස්ථානයේ වාර්ෂික වටිනාකම මත* | *වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියකට ස්ථානයේ වාර්ෂික වටිනාකම මත* |
|---|---|---|
| 01. දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට (තාවකාලික දැන්වීම් පුවරු හා ගුවන් පුවරු) | රු. 25.00 | - |
| 02. ස්ථිර දැන්වීම් පුවරුවකට | - | රු. 40.00 |

03. දැන්වීම් පුවරු හෝ ඊට වැඩි ඒවා සඳහා රු. 250ක තැන්පතු මුදලක් සභාවේ රැඳවිය යුතුය.
04. ගුවන් දැන්වීම් පුවරු 05ක් හෝ ඊට වැඩි ඒවාට රු. 250ක තැන්පතු මුදලක්

01-533

---

### අරණායක ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

### රථ වාහන නවතා තැබීම පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

01. 2004 ජූනි මස 04 වෙනි දින අංක 1344 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද අරණායක ප්‍රාදේශීය සභාවේ රථ වාහන නවතා තැබීම පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ දින සිට අවලංගු වන්නේ ය.

02. මෙම අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රථ වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. මෙහි මින් මතු සභාපතිවරයා යනුවෙන් හඳුන්වනු ලබන අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම හෝ නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන යම් වීථියක, වීථියක කොටසක වාහන සඳහා වෙන් කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කරන දැන්වීමක් ඒ වීථියෙහි හෝ නැතහොත් වීථියක කොටසක ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

04. මෙහි තුන්වන වගන්තියෙහි දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කර තැබීම හෝ නතර කර තැබීම තහනම් කර ඇති අවස්ථාවක වාහනයක රියැදුරු විසින්

i. කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියෙකු විසින් ඒ වීථියෙහි හෝ කොටසෙහි ඉදිකරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනනුකූලව ක්‍රියා කිරීම ; *හෝ*

ii. ඒ වීථියෙහි හෝ වීථියේ කොටසේ ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනා ගමන පිළිවෙල නිසි පරිදි අනුගමනය නොකිරීම ; හෝ

iii. කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයෙන් ගොඩවීමට ඉඩ දීම ; හෝ

iv. එම වාහනයට බඩු පැටවීම හෝ එම වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනයේ වීථියේ හෝ වීථියේ කොටසෙහි නතර කර තැබීමට සැලසීම කරනු නොලැබිය යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවීමෙන් පසු සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් තමා සන්තකයේ ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පලවෙනි උපලේඛනයේ මෝටර් වාහන නවතා තැබීම සඳහා වෙන්කර ඇති ස්ථානයක තම මෝටර් වාහනය නවත්වා තැබීම නොකල යුතු වන්නේ ය.

06. මෙම උපලේඛනයේ දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු ද පලවෙනි උපලේඛනයේ සඳහන් මෝටර් වාහන නවතා තැබීමේ ස්ථාන ද සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කර ගැසට් පත්‍රයේ පල කිරීම මගින් කලින් කල සංශෝධනය කිරීමේ බලය ද සභාව සතු වන්නේ ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම එම අවසර පත්‍රය නිකුත් කරන ලද්දේ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංකය පැහැදිලිව සටහන් විය යුතු අතර, අවසර පත්‍රයේ සඳහන් කාල සීමාව සඳහා පමණක් එය වලංගු වන්නේ ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙකුම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි වාහනය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

09. පොලිස් නිලධාරියෙකු රථ වාහන පාලකයෙකු, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බලය පවරන ලද කවර හෝ තැනැත්තෙකු විසින් වාහන නතර කර ඇති පොදු ස්ථානයක නතර කර ඇති යම් මෝටර් වාහනයක් අයිතිකරුගෙන් නැතහොත් රියැදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු විසින් ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

10. කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක කිසියම් නිශ්චිත පන්තියක් හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබ ඇති විට කිසියම් තැනැත්තෙකු විසින් එම පංතියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකල යුත්තේ ය.

11. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළු වන හෝ ඉන් පිටවන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධා වන ආකාරයට කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම නොකල යුතු වන්නේ ය.

12. වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති පොදු ස්ථානයකට ඇතුළු වීම හා පිටවීම සඳහා වෙනම මාර්ග පහසුකම් සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් දන්වා ඇති අවස්ථාවක නියමිත මාර්ගයෙන් හැර කිසියම් මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුළු වීම හෝ පිටවීම නොකල යුතු වන්නේ ය.

13. දම්වැල් හෝ කුළුණු හෝ දම්වැල් සහ කුළුණු යන දෙවර්ගයම සපයා ඇති පොදු නැවතුම් පොලක නතර කර ඇති මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙකට පිළිවෙළින් එකම පැත්තකට මුහුණු ලා නතර කර තැබිය යුතු අතර ඉදිරියේ හිස්තැන් ඇතිවන අනුපිළිවෙලට අනුව අනුක්‍රමිකව එම වාහන ඉදිරියට ගෙන ගිය යුතු වන්නේ ය.

14. මෝටර් වාහන නවතා තබා ඇති පොදු ස්ථානයකට මෝටර් වාහනයක් නතර කර තිබිය දී කිසියම් තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකල යුතු වන්නේ ය.

15. කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතර කර ඇති පොදු ස්ථානයකින් මෝටර් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා අලුත්වැඩියාවක් කිරීමට අවශ්‍ය වන්නේ නම් හැර වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර ඇති වාහනයක කිසියම් ආකාරයක අලුත්වැඩියාවක් නොකල යුතු වන්නේ ය.

16. මෝටර් වාහන නවතා තබන ස්ථානයක කිසිවෙකු විසින් විෂ මත් ද්‍රව්‍ය භාවිතය හෝ වෙළඳාම් කිරීම හෝ අනිසි ආකාරයෙන් හැසිරීම නොකල යුතු වන්නේ ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව එක් එක් දිනයන්හි පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා කාලය දක්වා පමණක් ක්‍රියාත්මක විය යුතුය. මෙම කාල වේලාවන් සභාපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයක් මගින් වරින් වර සංශෝධනය කළ හැක්කේ ය.

18. වෙනත් විශේෂ කාර්යයන් සඳහා නිත්‍ය කුලී රථ නතර කර ඇති ස්ථාන භාවිතයට ගැනීම හෝ සභාපතිවරයා විසින් දෙනු ලබන විශේෂ අවසර පත්‍රයක් මත විශේෂ අවස්ථාවන් වල දී එම ස්ථාන වල වෙනත් කාර්යයන් සඳහා මෝටර් වාහන නවතා තැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

19. නියමිත ආකෘති පත්‍රය පුරවා වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම අයදුම්කරුවෙකුම අදාල වර්ෂයේ පලමු මාසය ගත වීමට පෙර දෙවන උපලේඛනයේ දැක්වෙන නියමිත ගාස්තු ගෙවා අවසර පත්‍රය අලුත් කර ගත යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීමක් හෝ නොකර හැරීමක් වරදක් වන අතර කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට සහ එකී උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරනු ලබන සෑම අවස්ථාවකම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙන් නියම කර ඇති දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෝටර් වාහනයක් යන්නෙන් ලොරියක් ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් ත්‍රිරෝද රථයක් යතුරු පැදියක් යන්ත්‍රානුසාරයෙන් ගමන් කරනු ලබන වෙනත් කුමන හෝ වාහනයක් අදහස් වන්නේ ය.

''සභාව'' යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාව අදහස් වන්නේ ය.

''සභාපති'' යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වන්නේ ය.

''වාහන පාලක'' යන්නෙන් සභාවෙන් පත් කරන ලද බලය ලත් නිලධාරියෙකු අදහස් වන්නේ ය.

''පොලිස් නිලධාරියා'' යන්නෙන් පොලිස් දෙපාර්තමේන්තුවට අයත් පොලිස් නිලධාරියෙකු අදහස් වන්නේ ය.

උපලේඛන 01

| වාහන නතර කිරීමට නියමිත ස්ථාන | ත්‍රීවීලර් | ට්‍රැක්ටර් | වෑන් | ලොරි | යතුරු පැදි |
|---|---|---|---|---|---|
| දිප්පිටිය නගරය | පොදු වෙළඳපල ඉදිරිපිට හෙම්මාතගම බස් නැවතුම අසල (ලංකා බැංකුව අසල) විල්පල හන්දිය, මේනම හන්දිය, රෝහල හන්දිය | දිප්පිටිය තල්ගස්පිටිය පාරේ සිට රෝහල දෙසට | 1. පොදු වෙළඳපල ඉදිරිපිට වෑන් 10ක් 2. වැලිගම කඩේ ඉදිරිපිට 3. මාළු වෑන් පොදු වෙළඳපල පිටුපස | | |
| ගැවිලිපිටිය නගරය | දෙබත්ගම පාර අසල එස්. ඕ. වෙළඳසැල ඉදිරිපිට ගාලේකඩේ හන්දිය නාරංගම්මන මාර්ගය අසල | | | | |
| පොල්අඹේගොඩ | නිකපිටිය මාර්ගය (පන්සල ඉදිරිපිට) ගොඩිගමුව මාර්ගය ඉදිරිපස පොල්අඹේගොඩ පැහැණිපැද්දර හන්දිය | | | | |
| අළුපොත | ලීලාගම මාර්ගයේ හන්දිය අසල අට්ටාපිටිය සුමනතිස්ස මාවත අසල | | | | |
| උස්සාපිටිය | ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණය ඉදිරිපස සණස බැංකු ගොඩනැගිල්ල ඉදිරිපස ගල්අතර මාර්ගයේ හන්දිය අසල 08 කණුව හන්දිය අසල සුදුගල මාර්ගයේ හන්දිය අසල | තුත්තිරිපිටිය බස් නැවතුම්පොලේ සිට ගල්අතර පාර දෙසට | උඩවත්ත කඩේ ඉදිරිපිට | ගල්අතර පාර දිගට | |
| ඇරැව්පොල | ඇරැව්පොල දසනායක කඩේ ඉදිරිපස | | | | |
| තුත්තිරිපිටිය | තුත්තිරිපිටිය හන්දිය යාලපල හන්දිය වාකිරිපල අම්බලම අසල | | | | |
| අස්මඩල | අස්මඩල ගුරුබැවිල මාර්ගය අසල ගිරාඅඹේ කඩමණ්ඩිය ඉදිරිපස | | | | |
| අරණායක | හොරේවල නගරය (රබර් කඩේ ඉදිරිපස) අරණායක නගරය (බෝගස ඉදිරිපස) තැපැල්හල ඉදිරිපස, උග්ගොඩ හන්දිය (පාලම අසල) | | | | |
| අම්බලකන්ද | අම්බලකන්ද පාසල ඉදිරිපස බෝගස අසල | | | | |
| ගංතුන | ගංතුන උඩගම බස් නැවතුම ඉදිරිපිට (පාලම අසල) දෝතල්ඔය මාර්ගයේ හන්දිය (හුළං කපොල්ල අසල) ගංතුන මාර්ගයේ නාරංගල ආරාමය අසල | | | | |
| රහල | බණ්ඩාරවත්ත හන්දිය අසල බූවැලිකඩ හන්දිය, සැලව සමූපකාරය අසල | | | | |
| රංදිලිගම | රංදිලිගම මාර්ගයේ හන්දිය අසල බූවැලිකඩ සැලව මාර්ගයේ හන්දිය අසල | | | | |
| වැලිමන්න | වැලිමන්න ගැටබෙරිකන්ද පාර අසල සැලව සමුපකාරය අසල | | | | |
| ගල්බොක්ක | ගල්බොක්ක මාර්ගය අසල | | | | |
| මෝරාගම්මන | මෝරාගම්මන හන්දිය අසල | | | | |

උපලේඛන 01

| *වාහන නතර කිරීමට නියමිත ස්ථාන* | *ත්‍රීවීලර්* | *ට්‍රැක්ටර්* | *වෑන්* | *ලොරි* | *යතුරු පැදි* |
|---|---|---|---|---|---|
| හත්ගම්පල | හත්ගම්පල එළඟිපිටිය මාර්ගයේ හන්දිය අසල, හත්ගම්පල පාසල හන්දිය අසල | | | | |
| දෙබත්ගම | දෙබත්ගම නගරයේ කළුගල මාර්ගයේ හන්දිය අසල, දෙබත්ගම පන්සල අසල | | | | |
| ගල්ගස්පිටිය | තලාව මාර්ගය ඩබල් බෝක්කුව අසල හබලක්කාව කුරගල හන්දිය අසල | | | | |
| දෙවනගල | දෙවනගල හන්දිය දෙවනගල රජමහා විහාරයට හැරෙන තැන | | | | |
| තෙල්එක | තෙල්එක සාමගම හන්දිය අසල | | | | |
| කාල්වාන | කාල්වාන බුද්‍ද මැදුර අසල | | | | |
| මිල්ලන්ගොඩ | මිල්ලන්ගොඩ බෝගහ අසල | | | | |
| මාලිගාතැන්න | මාලිගාතැන්න විදුහල අසල | | | | |
| කන්දේවත්ත | කන්දේවත්ත මුළුගහමුල අසල | | | | |

2. (ආ) *උපලේඛනය :*

| *මෝටර් රථ වාහන වර්ගය* | *ගාස්තු* | *ස්ටිකර් සඳහා* |
|---|---|---|
| ත්‍රී වීලරයක් | වාර්ෂික 250/- | රු. 50/- |
| වෑන් රථයක්/මෝටර් කාරයක්/ට්‍රැක්ටරයක්/ ලොරියක් | මාසිකව 200/- | |

සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2008 නොවැම්බර් මස 24 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-536

---

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122 වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය 126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2009 දෙසැම්බර් මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

## වාහනවල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සභා මාර්ගවල ධාවනය වන වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. වරකාපොල ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මාර්ග යනුවෙන් ප්‍රකාශයට පත්කොට ඇති හා වෙනත් අධිකාරයකට අයත් නොවන්නාව වූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගවල බර වාහන ගමනා ගමනය විධිමත් කිරීම පාලනය කිරීම, ධාවන වේගය හා බර සීමාවන් පැනවීම හා මාර්ගවලට වන හානිය අවම කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

03. (1) මින් මතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තු ගෙවා ලබා ගන්නා ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, ඉහත දෙවන වගන්තියෙන් අර්ථ දැක්වෙන මාර්ගයට බර ටොන් 2ට වඩා වැඩිවන්නා වූ ටිපර් රථයක් ලොරි රථයක් ට්‍රැක්ටරයක් මාර්ග ඉදිකිරීමේ යන්ත්‍රයක් ධාවනය කිරීම හෝ ගල් වැලි ආදී සියලු ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් බණිජ ද්‍රව්‍ය හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතුය. තව ද මෙම මාර්ගයක් මතින් සතුන් ලවා හෝ ට්‍රැක්ටර් මගින් දැව කඳන් හෝ වෙනත් ද්‍රව්‍ය ඇදගෙන යාම නොකළ යුතුය.

03 (2) මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛණයන්හි සඳහන් වන ගාස්තු අවශ්‍යතාවය මත වරින් වර සංශෝධනය කිරීමේ බලය වරකාපොල ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

(3) වායු පීඩන රහිත කිසිදු වාහනයක් වෙනත් වාහනයක පටවා මිස ප්‍රාදේශීය සභාවේ කිසිදු මාර්ගයක ධාවනය කිරීම නොකළ යුතුය.

04. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක ධාවනය කළ හැකි උපරිම වේග සීමාව පැයට කි. මී. 25 නොයික්ම විය යුතුය.

05. (1) කිසියම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන වගන්තියෙන් අර්ථ නිරූපණය වන මාර්ගයකින් මෙම අතුරු ව්‍යවස්ථාවේ තුන්වන වගන්තියේ (1) සඳහන් ද්‍රව්‍යයක් යන්ත්‍ර හෝ උපකරණ ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවේ සභාපතිවරයා වෙත යටත් පිරිසෙයින් දින 03කට වත් පෙර ඉදිරිපත් කල යුතුය.

05. (2) ඉහත 5 (1) අනු වගන්තිය අනුව ඉල්ලීමක් ලැබුණ කල්හි සභාපතිවරාය විසින් කාර්මික නිලධාරී හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවා නියමිත ගාස්තුව හා හානි විය හැකි ප්‍රමාණයට වන ඇප තැන්පත් මුදලක් ලබාගත යුතුය.

05. (3) ඉහත 5(2) අනු වගන්තිය යටතේ ඇප මුදල් හා නියමිත ගාස්තු අය කිරීමෙන් පසු ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මිස අදාල අවසරය ලබා නොදිය යුතුය.

05. (4) ඉහත 5(3) අනු වගන්තිය යටතේ ලබා ගනු ලබන ඇප තැන්පතු මුළද නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමක් ලද විට ප්‍රථමයෙන් 10% දෙපාර්තමේන්තු ගාස්තු ද අනතුරුව හානියක් වී ඇතොත් එකී අලාභය ද තක්සේරු කර අයකර ගත යුතුය.

05. (5) හානිය ඇප තැන්පතු මුදල ඉක්මවා යයි නම් එම අතිරේක මුදල ද ගෙවන ලෙස අදාල පුද්ගලයාට නියම කිරීම නීත්‍යානුකුල වේ. එසේම හිග මුදල ගෙවන ලෙස නියම කර ඇති අවස්ථාවකදී ගෙවීම පැහැර හරින්නේ නම් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකට නඩු පවරා හිග මුදල් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේ ය.

05. (6) 5 (5) අනු වගන්තියේ විධිවිධානයන් අනුගමනය කිරීම සාධාරණ නොවන්නේ යැයි සභාවේ සභාපතිවරයාට හැඟී යන අවස්ථාවකදී ඒ සඳහා යම් සහනයක් ප්‍රධානය කිරීමට සභාවේ මහා සභා අනුමැතියට යටත්ව සිදු කිරීමට සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේ ය.

06. ප්‍රාදේශීය සභාව සමග සංවර්ධන කටයුතු වලට අදාල ගිවිසුම් වලට එළඹී ඇති කොන්ත්‍රාත් කරුවන් විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම් මගින් මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ගාස්තු වලින් නිදහස් කර ගත හැකිය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම පරීක්ෂා කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන වෙනත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකුල වන්නේ ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩ කිරීමක්ම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ නියම කර ඇති දඩයකට ද එම කඩ කිරීම දිගින් දිගටම සිදු කරන්නේ නම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ නියම කර ඇති අතිරේක දඩයන්නට ද යටත් වන්නේ ය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව යන්නෙන් වරකාපොල ප්‍රාදේශීය සභාව ද, සභාපතිවරයා යන්නෙන් වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, ලේකම් යන්නෙන් වරකාපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයා ද වෙනත් බලය පවරන ලද නිලධාරියෙකු යන්නෙන් ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියෙකු ද, ග්‍රාම නිලධාරියෙකු ද, පොලිස් නිලධාරියෙකු ද අදහස් වේ.

### උපලේඛනය - 01

(i) කියුබ් 1 1/2 වැඩි හා කියුබ් 2 දක්වා වාහනයක් සඳහා ආපසු ගෙවන තැන්පත් මුදල මාසයක් සඳහා රු. 2,500 කි. එක් වාරයක් සඳහා රු. 100 ක බලපත්‍ර ගාස්තුවක්,

(ii) කියුබ් 2 වැඩි කියුබ් 4 දක්වා ආපසු ගෙවන තැන්පත් මුදල මාසයක් සඳහා රු. 3,750 කි. එක් වාරයක් සඳහා රු. 200 ක බලපත්‍ර ගාස්තුවක්

(iii) කියුබ් 4 වැඩි ආපසු ගෙවන තැන්පත් මුදල මාසයක් සඳහා රු. 5,000 කි. එක් වාරයක් සඳහා රු. 500 ක බලපත්‍ර ගාස්තුවක්,

(iv) හෙක්ටයාර් 1ක් හෝ ඊට වැඩි රබර් ඉඩමක හෝ වෙනත් ඉඩමකට දැව දරට හෝ වෙනත් කාරයයක් සඳහා ප්‍රවාහනය කිරීමේදී රු. 3,750ක ආපසු ගෙවන තැන්පත් මුදලක් හා එක් ගමන් වාරයක් සඳහා රු. 100 ක බලපත්‍ර ගාස්තුවක් අය කිරීම,

(v) දැව ප්‍රවාහනයේදී එක් ගමන් වාරයක් සඳහා රු. 2,500ක් ආපසු ගෙවන තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රු. 500ක බලපත්‍ර ගාස්තුවක්,

(vi) බලය පවරනු ලබන ප්‍රාදේශීය සභා නිලධාරියෙකු අදාල ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරී සමග ගොස් පරීක්ෂා කිරීමෙන් පසුව එම වාහනයෙන් මාර්ගයට යම් අලාභයක් සිදු වී ඇති බව තහවුරු වුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකිය.

(vii) එක් එක් ප්‍රාදේශීය සභා මාර්ගයේ ප්‍රවාහනය කළ හැකි උපරිම බර ප්‍රමාණය නියම කිරීම හා අලි ඇතුන් ලවා කොටන් ඇද්දවීම තහනම් බව ප්‍රදර්ශනය කිරීම සඳහා දැන්වීම් පුවරු සවි කිරීමේ බලය වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතු වන්නේය.

01-538

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.